# බළන්ගොඩ නගර සභාව

## 2022-08-09 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.08.09**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රුමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රිනී | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 16. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |
| 17. ගරු නාගරික මන්ත්‍රී | එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් ඩී.එම්.ජේ.යූ.ධර්මරත්න මයා

**01. පසුගිය සභාවේ 2022-07-15 දිනැති මහා සභා වාර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව 2022-07-15 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා, 2022-07-15 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසූ අතර, සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2022-07-15 දිනැති මහ සභා වාර්තාව ගරු සභාවේ සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- ගරු සභාපතිතුමා නිවේදන වාරය ආරම්භ කරමින් පසුගිය කාලයේ රට තුළ විශාල ව්‍යාකූල තත්ත්වයක් පැවති අතර, සියලුම පක්ෂ එකතු වී සර්වපාක්ෂික ආණ්ඩුවක් නිර්මාණය කරන බව පෙනී යන නමුත් ජනතා විමුක්ති පෙරමුණ ඒ සම්බන්ධ සාකච්ඡාවෙන් ඉවත් වූ බවට නිවේදනයක් නිකුත් කර තිබූ බව ද මෙම මොහොතේ සියලු දෙනා එක්ව රට ගොඩනැඟීමට කටයුතු කළ යුතු බව ද ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සහ ගරු අග්‍රමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට සභාව වෙනුවෙන් සුබ පැතුම් එක් කරන අතර එතුමන්ලාගේ දේශපාලන පරිණතභාවය යොදා ගනිමින් රට ස්ථාවරත්වයට පත් කිරීමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන බව ද පැවසීය.

- පසුගිය කාලයේ පදික වෙළඳාම ඉවත් කිරීම නිසා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, හිටපු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා සහ අප දෝෂාරෝපණයට ලක් වූ අතර, මේ වන විට පළතුරු ඇතුළු විවිධ ද්‍රව්‍ය මෙන්ම මත්ද්‍රව්‍ය පවා අලෙවි කරන තැනක් බවට පදික වේදිකාව පත් වී ඇති බව ද මේ නිසා නගරය තුළ විශාල ප්‍රශ්නයක් උද්ගත වී ඇති බව ද මෙම අය අසභ්‍ය වචන භාවිත කරමින් අනවසර වෙළඳාම් සිදු කිරීම මඟින් එය මහජනතාවට හා නගරයට අවහිරයක් වන බැවින් තව අවස්ථාවක් දෙන්නේද යන්න පිළිබඳව පොලීසිය සමඟ සාකච්ඡා කර තීරණය කරන බව ද එසේ නොමැති නම් දේශපාලනය නොබලා සියලුම දෙනා පදික වේදිකාවෙන් ඉවත් කිරීමට තමා අදහස් කරන බව ද ඒ සඳහා සභා තීරණයක් අවශ්‍ය නොවන අතර, සභාපතිවරයාගේ බලතල අනුව ඉදිරියේ දී

ඉවත් කිරීම සිදු කරන බව ද සභාව දැනුවත් කිරීම තමාගේ යුතුකමක් බැවින් මෙම නිවේදනය සිදු කරන බව ද පවසන ලදී.

- සෞඛ්‍ය කමිටුව හා කර්මාන්ත කමිටුව ඉතා දුර්වල තත්ත්වයක පවතින අතර, අදාල කමිටු සභාපතිවරුන් මේ සම්බන්ධව අවධානය යොමු කළ යුතු බව ද ඇතැම් ගරු නාගරික මන්ත්‍රීවරුන් පසුගිය මහ සභාවෙන් පසු දක්නටවත් නොලැබෙන බව ද තම වගකීම් පැහැර නොහැර කටයුතු කරන ලෙස ද ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් කර්මාන්ත කමිටුවේ දී අවධානයට යොමු කළ කාරණය සම්බන්ධයෙන් අවශ්‍ය තාර බැරල් ප්‍රමාණය අද දින ලැබී ඇති බව ද පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පෙ.ව.10.11 ට සභාවට පැමිණෙන ලදි.**

**ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා පෙ.ව.10.12 ට සභාවට පැමිණෙන ලදි.**

**ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා පෙ.ව.10.16 ට සභාවට පැමිණෙන ලදි.**

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය විසින් 2022 වසරේ දී අන්තර් පළාත් පාලන විවාද තරඟාවලියක් පැවැත්වීමට කටයුතු යොදා ඇති අතර, සියලු තරඟකරුවන් හා තරඟකාරියන් මහජන නියෝජිතයින් වීම අනිවාර්ය බවත්, නිත්‍ය තරඟකරුවන් 04 දෙනෙක් සහ අතිරේක දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ යුතු බවත්, පවසමින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ගරු සභාපතිතුමන් විසින් ගරු නාගරික මන්ත්‍රීතුමන් හා තුමියන්ගේ සියලුම නම් යෝජනා කළ නමුත් ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා පමණක් කැමැත්ත ප්‍රකාශ කරන ලදී.

- නගර සභා ක්‍රීඩා පිටියේ කෙළවරක ඇති මේ වන විට කැඩී ඉවත් කර දිරාපත් වෙමින් පවතින පාපන්දු ගෝල්කණු අලුතින් වෑල්ඩින් කර ක්‍රීඩාව සඳහා භාවිතා කිරීමට අදහස් කර ඇති බවත්, ඒ සඳහා අවසර ලබා දෙන ලෙසත් ඉල්ලා බළන්ගොඩ පාපන්දු සංගමය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදි.

  මේ සඳහා බළන්ගොඩ පාපන්දු සංගමය වෙත අවසර ලබා දීමට සභාව විසින් තීරණය කරන ලදී.

- 2022-08-08 වන දින අංක 2292/09 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් (262 අධිකාරිය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 66 අ(1) වගන්තිය යටතේ බළන්ගොඩ නගර සභාවේ සභික ධූරයේ පුරප්පාඩුව පිරවීම සඳහා සුන්දරම් අරුලප්පු ජෝර්ජ් යන අය පත් කර ඇති බවට වන දැන්වීම ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

- බළන්ගොඩ නගරයේ ගංවතුර පාලනය කිරීම සඳහා දොරවෙල (මුගුණමලය) පහළ ගංගා නිම්නය පුළුල් කර ගං ඉවුර ආශ්‍රිතව ක්‍රමවත් ගංවතුර පාලන සැලැස්මක් ක්‍රියාත්මක කරන ලෙස පවසමින් බළන්ගොඩ, කොටුගොඩැල්ල පාර, 11/4/ඒ කොටුව පෙදෙස ලිපිනයේ පදිංචි ගාමිණි අනුර වීරසේකර යන අය විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසූයේ පසුගිය ගංවතුර තත්ත්වයෙන් පසුව ගඟ පුළුල් කළ බැවින් ගංවතුර පාලනයක් සිදු වූ බවයි.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් මේ සම්බන්ධව තමන් පෞද්ගලිකව අදාල ආයතන වෙත ලිපි යොමු කළ අතර, ඒ සඳහා පිළිතුරු ලැබී ඇති බව ද එම ලිපිගොනුව සමඟ ඉදිරියට කටයුතු කිරීමෙන් නාගරික සංවර්ධන අධිකාරිය හරහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගත හැකි බව තමාගේ මතය බව ද පවසන ලදී.

- මහජන සුභ සිද්ධිය සඳහා අවමංගල්‍යාධාර සමිතියේ කටයුතු වෙනුවෙන් කුඩා ගොඩනැඟිල්ලක් (කාමරයක්) තනා ගැනීමට සේනක පෙදෙසේ එකතු වී තිබූ විශාල කසළ ගොඩ ඉවත් කිරීමෙන් ලැබී ඇති කුඩා බිම් කඩ ලබා දෙන ලෙස ඉල්ලමින් බළන්ගොඩ, කොටුගොඩැල්ල පාර, 11/4/ඒ කොටුව පෙදෙස ලිපිනයේ පදිංචි ගාමිණි අනුර වීරසේකර යන අය විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් සේනක පෙදෙසේ පවතින එකම හිස් ඉඩම මෙය බවත්, තමන් රු.ලක්ෂ 03 ක් වියදම් කර පැති බැම්මක් ඉදි කළ අතර, සමිතිය සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට මෙම ස්ථානය සුදුසු හා කාලෝචිත බවත් පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසූයේ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා සමග වැඩ අධිකාරීතුමා විසින් ස්ථානීය පරීක්ෂාවක් සිදු කර වාර්තාවක් ලබා දෙන ලෙස හා එම වාර්තාවට අනුව මෙම ස්ථානය ලබා දීමට හැකි නම් සමිතිය සමඟ ගිවිසුමකට එළඹ නිර්ණායකවලට යටත්ව ලබා දීම සුදුසු බවයි.

- 2022-04-02 දින පැවැත්වීමට තිබූ සංගීත ප්‍රසංගය රටේ පැවති තත්ත්වය අනුව අවලංගු වූ අතර නැවත එම ප්‍රසංගය 2022-09-09 දින පැවැත්වීම සඳහා නගර සභා ක්‍රීඩාංගනය ලබා දෙන ලෙස බළන්ගොඩ, බෝම්බුව, මස්සැන්න පාර ලිපිනයේ එමිල් ප්‍රියශාන්ත ප්‍රනාන්දු යන අය විසින් කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු සභාපතිතුමන් අදහස් දක්වමින් මේ සම්බන්ධව 2022-04-06 දිනැති මහ සභාවේ 06:01:10 යටතේ ලබා ගත් සභා තීරණය අනුව විනෝද බද්ද ඇතුළු ගිවිසුම් කොන්දේසි මත මෙම සංගීත ප්‍රසංගය පැවැත්වීමට අවසර ලබා දිය හැකි අතර, පසුගිය සභාවක දී සභා අනුමැතිය ලැබුණු සංගීත ප්‍රසංගය අවලංගු වූ බැවින් නැවත එම ප්‍රසංගය පැවැත්වීම වෙනුවෙන් සභා තීරණයක් ගැනීම අවශ්‍ය නොවන බව ද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා පෙ.ව.10.28 ට සභාවට පැමිණෙන ලදී.**

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.**

අද දින ටෙන්ඩර්පත් හා මිළ ගණන් ඉදිරිපත්ව නොමැති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**05. කල් දී ඇති ප්‍රශ්න**

**05:01 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

05:01:01 මාර්ග කිලෝමීටර ලක්ෂයක් කාපට් කිරීමේ ව්‍යාපෘතිය යටතේ කාපට් කළ මාර්ග විස්තරය කුමක් ද?

1. පුවක්ගහමුල්ල මාර්ගය
2. කිරිඳිගල ශෛලතලාරාම මාර්ගය
3. කිරිඳිගල වැලිහරනාව හරහා ප්‍රාර්ථනා බෝධිය මාර්ගය
4. වැව්වත්ත උද්‍යාන මාර්ගය
5. නගර සභාව අසල සිට කොටුගොඩැල්ල දක්වා මාර්ගය
6. සමනලවත්ත මාර්ගයේ සිට සුදර්ශනගම දක්වා මාර්ගය
7. යක්දෙහිකන්ද මාර්ගය
8. දෙල්ගස්වත්ත මංසන්ධියේ සිට ඉහළට හුණුකුඹුර කෝපිවත්ත මාර්ගය
9. පුරණගෙදර මාර්ගය
10. නගර සභා හන්දියේ සිට මහමෙව්නා භාවනා අසපුව දක්වා මාර්ගය
11. කිරිඳිගල සිට බලවත්කඳුර ගම දක්වා මාර්ගය
12. කනගනායගම් දෙමළ විද්‍යාල මාවත

05:01:02 ඒ අතුරින් මාර්ග කීයක් නගර සභාවට නීත්‍යානුකූලව බාරගෙන තිබේද?

මාර්ග 12 ක් බාරගෙන තිබේ.

මෙහි දී අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුවේ බුලත්ගම සිංහල පාසල් මාර්ගයේ අඩුපාඩු රැසක් පවතින බැවින් සභාවට පවරා ගැනීමේ දී ඒ සම්බන්ධව සැලකිලිමත් විය යුතු බවත්, පවරා ගත් පසුව ඔවුන් එහි වගකීම නොගන්නා බවත් ය.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් වැඩ අධිකාරී හා කාර්මික නිළධාරී විසින් මාර්ගයන් අධීක්ෂණයට ලක් කර පවරා ගැනීමට සුදුසු බවට නිර්දේශ කළහොත් තමන් අත්සන් යොදන බව පැවසීය.

**05:02 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා**

05:02:01 නගර සභා තානායමේ ගිය සභා වාරයේ දී ගත් තීරණය නැවත සාකච්ඡා කිරීම

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා මේ සම්බන්ධව අදහස් දක්වමින් තානායම පිළිබඳ සියලු ලිපි තමන් විසින් අධ්‍යයනය කළ බැවින් මෙය නැවත සාකච්ඡා කිරීමට අවශ්‍ය නැති බව ද තානායමේ රට බීම හලෙහි වහල හැකි ඉක්මනින් සකස් කර දෙන ලෙස ද එසේ නොමැති වුවහොත් විශාල දඩ මුදලක් නගර සභාවට ගෙවීමට සිදු වන බව ද පැවසීය.

**05:03 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

05:03:01 සභාවේ කතිකා කරගත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලත් කොම්පෝස්ට් අංගනයට සැලසුම් කරන ලද දාහක යන්ත්‍රය ලබා ගැනීමේ වර්තමාන තත්ත්වය පැහැදිලි කරන්න.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී දාහක යන්ත්‍රය ලබා ගැනීම පිළිබඳව තීරණ ගත් අතර, ගරු ආණ්ඩුකාරතුමා හා පළාත් පාලන කොමසාරිස්තුමා ඇතුළු අදාල නිලධාරීන් දැනුවත් කර ඇති බව පවසන ලදී.

කෙසේ නමුත් එම යන්ත්‍රය නොලැබුණහොත් ඉදිරියට වසර 02 කට වඩා කොම්පෝස්ට් ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යා නොහැකි බව ද තමන්ගේ පාලන කාලය තුල මෙම ව්‍යාපෘතිය ගොඩනැගීමට උපරිම උත්සාහය ගන්නා බව ද එම ප්‍රදේශයේ මිනිසුන් වෙනුවෙන් අවශ්‍ය පහසුකම් පවා සලසා දුන් බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා පැවසූවේ මෙම පාලන කාලය තුළ ඉටු නොකරහොත් අනාගතයේ දී දෝෂාරෝපණයකට ලක් විය හැකි බැවින් කඩිනමින් සිදු කිරීම කළ යුතු බවයි.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා, බළන්ගොඩ පළාත් පාලන ආයතන තුනෙහිම සිටින ගරු සභාපතිවරුන් එකතු වී කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා පොදු ස්ථානයක් සකස් කර ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**06. කල් දී ඇති යෝජනා**

**06:01 ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා**

06:01:01 ගබඩා අවශ්‍යතා සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

| අවශ්‍ය ද්‍රව්‍ය | දැනට ගබඩාවේ ඇති ප්‍රමාණය | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|
| A4 Bundle | - | 50 |
| හාෆික් | 02 | 200 |
| ඉදල් | - | 150 |
| කලු පෑන් | 20 | 100 |
| රතු පෑන් | 20 | 100 |
| වවුචර් කොළ | 50 | 2000 |
| Torch Battery | - | 50 |
| CR (V) | - | 10 |
| ටිපෙක්ස් | 02 | 12 |
| රතු A4 කොළ | 50 | 500 |

| | | |
|---|---|---|
| ඉන්ධන ඉල්ලීම් කොළ | 100 | 2000 |
| ගමන් වියදම් කොළ | 100 | 1000 |
| ධාවන සටහන් පොත් | 04 | 50 |
| පැමිණීමේ ලේඛන | - | 10 |
| සභා වාර්තා අලවන පොත් | 01 | 10 |
| ළමා පැමිණීමේ ලේඛන | 02 | 10 |
| 6 x 3 ලියුම් කවර | 100 | 500 |
| 10 x 15 ලියුම් කවර | 25 | 100 |
| මකන | 03 | 10 |
| CR (iv) | 03 | 20 |
| ගම් බෝතල් (පොඩි) | - | 25 |
| කම්පියුටර් ෂීට් (සරප්) | 02 | 10 |
| ග්ලාස් ක්ලිනර් | 04 | 10 |
| සෙලෝටේප් ලොකු | 05 | 10 |
| සෙලෝටේප් පොඩි | 04 | 10 |
| AAA Battery | 02 | 12 |
| මුද්‍රිත ලියුම් කවර | 02 | 5000 |
| නිවාඩු කොළ | - | 1000 |
| ගබඩා අවශ්‍යතා කොළ | 200 | 1000 |
| පෙළපොත් | 10 | 200 |
| නොමිලේ ගලි සේවා සැපයීමේ පොත් | 10 | 100 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී Torch Battery ලබා ගැනීම සම්බන්ධව අදාල නිලධාරීන්ගෙන් කරුණු විමසා බැලීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:02 රටේ පවතින අර්බුදය හේතුවෙන් 2022 ජූනි සහ ජූලි මාස දෙකෙහි උපකාරක පංති නොපැවැත්වුණු බැවින් ටෙන්ඩර් ලබා ගෙන ඇති දූන්වීම් පුවරු 10 හි ජූනි හා ජූලි මස ගාස්තු ගෙවීම ප්‍රමාද වූ බවත්, ප්‍රමාද ගාස්තු අය නොකරන ලෙසත් අදාල ටෙන්ඩර්කරු විසින් ඉල්ලා ඇති අතර, ඒ අනුව 2022 ජූනි සහ ජූලි මාස දෙක සඳහා ප්‍රමාද ගාස්තු අය නොකර සිටීමට සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් රටේ පවතින වත්මන් තත්ත්වය මත උපකාරක පංති නොපැවැත්වීම නිසා දූන්වීම් පුවරු සඳහා ගුරුවරුන්ගෙන් මුදල් ලබා ගැනීමට නොහැකි වීම මත ඒ.සුමිත් කුමාර යන අය විසින් ටෙන්ඩර් ලබා ගෙන ඇති දූන්වීම් පුවරු 10 හි ජූනි සහ ජූලි මස ගාස්තු ගෙවීම ප්‍රමාද වූ බව දන්වා ඇති අතර, එම මාස දෙක සඳහා ප්‍රමාද ගාස්තු අය නොකර සිටින ලෙස ඉල්ලීමක් කළ බව පවසන ලදී.

එමෙන්ම 2022-01-01 දින මෙම ටෙන්ඩරය ඒ.සුමිත් කුමාර යන අය ලබා ගත් නමුත් බළන්ගොඩ නගර සභාවේ අතපසු වීමක් හේතුවෙන් දූන්වීම් පුවරු 10 අලුත්වැඩියා කර ටෙන්ඩර්කරුට ලබා දීමට මාස 02කට අධික කාලයක් ගත වූ බැවින් සහ එම ප්‍රමාද වූ මාස දෙකට අදාල ගාස්තු ටෙන්ඩර්කරු විසින් සම්පූර්ණයෙන්ම ගෙවූ බැවින් ඔහු විසින් ජූනි හා ජූලි මාස දෙක සඳහා ප්‍රමාද ගාස්තු අය නොකර සිටින ලෙස කරන ලද ඉල්ලීම සලකා බැලිය හැකි බව ද වැඩිදුරටත් පැවසීය.

ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ටෙන්ඩර් ලබා ගෙන ඇති දූන්වීම් පුවරු 10 හි 2022 ජූනි සහ ජූලි මාස දෙක සඳහා ප්‍රමාද ගාස්තු අය නොකර සිටීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:03 තුඹගොඩ ග්‍රාම නිලධාරී වසමේ පවුල් 150 ක් සඳහා ගෙවතු වගාව වෙනුවෙන් කොම්පෝස්ට් පොහොර ලබා දීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් තුඹගොඩ ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ පවුල් 150 ක් ආහාර සුරක්ෂිතතා වැඩසටහන සඳහා දායක වී ඇති අතර, ගෙවතු සංවර්ධනය සඳහා ඔවුන් වෙත බෙදා දීමට කොම්පෝස්ට් පොහොර ලබා දෙන ලෙස රාස්සගල ගොවිජන සේවා මධ්‍යස්ථානය විසින් ඉල්ලීමක් කර ඇති බව ද ඒ අනුව එම පවුල් 150 සඳහා කොම්පෝස්ට් පොහොර ලබා දිම සුදුසු බව ද පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:04 වරිපනම් අංක 79/ඒ දරණ ගොඩනැගිල්ලෙහි වසර 10 කට ආසන්න කාලයක සිට කිසිදු ව්‍යාපාරයක් සිදු නොවන අතර, එවකට සිටි බදුකරු විසින් වරිපනම් ගෙවා නොමැත. එබැවින් එම ගොඩනැගිල්ල සඳහා හිඟ වරිපනම් ගෙවීම නිදහස් කර දෙන ලෙස විහාරාධිපති ස්වාමීන් වහන්සේ විසින් දන්වා ඇති අතර, ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙම ගොඩනැගිල්ල වර්තමානයේ දී වසා දමා ඇති බව ක්ෂේත්‍ර පරීක්ෂාවේදී තහවුරු වී ඇති අතර, අයවිය යුතු වරිපනම් ගාස්තු ලෙස රු.16,457.10 ක් පවතින බව පවසන ලදී.

එමෙන්ම ගොඩනැගිල්ලක් කුලියට නොදී තිබෙන කාල සීමාව සඳහා වරිපනම් අය කිරීමේ දී වරිපනම් අනුපාතික වශයෙන් අඩු කිරීමක් ගැන සලකා බැලිය හැකි අතර, එම ගොඩනැගිල්ල කුලියට දී නැති බවට ලිඛිත දැනුම් දීමක් සභාවට ලැබෙන දින සිට වරිපනම් අඩු කිරීම ආරම්භ වන අතර, එය නැවත පදිංචියට ගත් දිනයෙන් අවසාන විය යුතු බවද වැඩිදුරටත් පැවසීය.

ඒ අනුව වරිපනම් අංක 79/ඒ දරණ ගොඩනැගිල්ල සඳහා පවතින හිඟ වරිපනම් මුදල අය කර ගැනීමෙන් අනතුරුව ගොඩනැගිල්ල වසා දමා ඇති කාල සීමාවට අදාලව පමණක් වාර්ෂිකව අය විය යුතු වරිපනම් මුදලින් 50% ක් අය කර ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:05 බළන්ගොඩ බස් නැවතුම්පොළ හා මහජන පොළ පොදු වැසිකිළි නඩත්තු කටයුතු හා පිරිසිදු කිරීමේ ටෙන්ඩරය 2022-10-31 දින අවසන් වන බැවින් නැවත ටෙන්ඩර් කිරීම, අවම ලංසු මුදල තීරණය කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ බස් නැවතුම්පොළ හා මහජන පොළ පොදු වැසිකිළි නඩත්තු කටයුතු හා පිරිසිදු කිරීමේ ටෙන්ඩරය 2022-10-31 දින අවසන් වන බැවින් නැවත ටෙන්ඩර් කළ යුතු අතර අවම ලංසු මුදල තීරණය කළ යුතු බවත් පසුගිය වර්ෂයේ අවම ලංසු මුදල රු.77,110.00 ක් බවත් පවසන ලදී.

බළන්ගොඩ බස් නැවතුම්පොළ හා මහජන පොළ පොදු වැසිකිළි නඩත්තු කටයුතු හා පිරිසිදු කිරීමේ ටෙන්ඩරය 2022-10-31 දින අවසන් වන බැවින් නැවත ටෙන්ඩර් කිරීමටත්, මෙතෙක් පොදු වැසිකිළිය සඳහා පාරිභෝගිකයන්ගෙන් අය කර ගත් මුදල රු. 10.00 ක් වූ නමුත් නැවත ටෙන්ඩර් කිරීමේ දී මෙම මුදල රු. 20.00 ක් බවට පත් කිරීම සුදුසු අතර, ඒ අනුව අවම ලංසු මුදල වශයෙන් රු.154,220.00 ක

මුදල සුදුසු බවටත් ආපසු ගෙවනු ලබන ඇප තැන්පත් මුදල වශයෙන් රු.25,000.00 ක් හා අයදුම්පත්‍ර ගාස්තුව වශයෙන් රු. 2,500.00 ක මුදල සුදුසු බවටත් ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

එමෙන්ම පොදු වැසිකිළි නඩත්තු කටයුතු හා පිරිසිදු කිරීමේ ටෙන්ඩරයේ ගිවිසුම සඳහා "ස්වාභාවික විපත්, වසංගත,රජයේ නියෝග වැනි හේතුන් මත බදුකරුට නොවැළැක්විය හැකි හේතුවක් නිසා ව්‍යාපාරික ස්ථානය වසා දැමීමට සිදු වුවහොත් බදුකරුගේ ඉල්ලීම සලකා බලා මාසික සභා තීරණය මත යම් දින ගණනක් සඳහා කුලී මුදල් අය නොකර සිටීමට පළමු පාර්ශවය එකඟ වේ" යන්න අලුතින් ඇතුලත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:06 බළන්ගොඩ නගරයේ කැලි කසළ ඉවත් කිරීම සඳහා වන ටෙන්ඩරය 2022-10-31 දින අවසන් වන බැවින් නැවත ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ඇප තැන්පත් මුදල රු. 50,000.00 ක් හා අයදුම්පත්‍ර ගාස්තුව රු. 2,500.00 ක් වශයෙන් ගෙන බළන්ගොඩ නගරයේ කැලි කසළ ඉවත් කිරීම සඳහා නැවත ටෙන්ඩර් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:07 2021 වර්ෂයේ බළන්ගොඩ මහජන පුස්තකාල භාණ්ඩ සමීක්ෂණ ලේඛනය අනුව අස්ථානගත වී ඇති පොත්වල වටිනාකම රු. 3,809.00 ක් වන අතර, ඉන් 25% ක මුදල වන රු.952.25 ක මුදල කපා හැරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2021 වර්ෂයේ බළන්ගොඩ මහජන පුස්තකාල භාණ්ඩ සමීක්ෂණ ලේඛනය අනුව අස්ථානගත වී ඇති පොත්වල වටිනාකම රු.3,809.00 ක් වන අතර, ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලය නිකුත් කරන ලද අංක 2004/පුස/01 (2016 සංශෝධිත) චක්‍රලේඛය අනුව නැති වූ පුස්තකාල ද්‍රව්‍යවලින් 25%ක ප්‍රමාණයක් එනම්, රු.925.25 ක මුදලක් උපදේශක කමිටුවේ නිර්දේශ මත හා ආයතන ප්‍රධානීන්ගේ අනුමැතිය මත කපා හැරීම සිදු කළ හැකි බව ද ඒ සඳහා 2022-07-15 දින පැවති උපදේශක කමිටුවේ නිර්දේශය ලැබී ඇති බැවින් එම නිර්දේශය සභාව විසින් අනුමත කළ යුතු බව ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:08 සඳුන්ගම, රාස්සගල පාර, විලියම් රොක්ෂාන් නැමැති අය විසින් "කේ" පෝරමයේ සිදු වූ වැරදීමක් මත 2022 වර්ෂය වෙනුවෙන් කේ.නාන්පාලගන් යන අයගේ වරිපනම් මුදල ගෙවා ඇත. එබැවින් ඔහු විසින් වැරදීමකින් ගෙවූ රු. 1,800.00 ක මුදල නැවත ඔහු වෙත ලබා දීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. මන්ත්‍රී යෝජනා**

07:01 **ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

07:01:01 රාස්සගල පාරේ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වැසි ජල කාණු පද්ධතියෙහි ස්ථාන කිහිපයක වැසි ජලය එකතු වීම හේතුවෙන් විශාල වශයෙන් මදුරු කීටයන් සෑදී ඩෙංගු රෝගය පැතිරීමේ අවධානමක් ඇත. ඒ පිලිබඳව සොයා බලා උක්ත කාණු පවිත්‍ර කිරීමට වැඩසටහනක් පිළියෙල කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම් රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ මාර්ග සංවර්ධන අධිකාරිය ඇතුළු අදාල නිලධාරීන් මේ සම්බන්ධව දැනුවත් කර ඇති බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා**

07:02:01 තානායම් බදු කරු විසින් කුලිය අඩු කර ගැනීම සඳහා මා හට කළ ඉල්ලීම

07:02:02 ඉරිදා පොළේ පවතින මුර කුටිය බදු ක්‍රමයට දීමට යෝජනා කිරීම

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ගෑස් සහ ඉන්ධන තිබේ නම් තානායම කරගෙන යාමේ ගැටලුවක් නොමැති බව ද පසුගිය සභාවේ දී මත්පැන් අලෙවි කර රු. 90,000.00 ක දඩයක් අය කරගෙන ඇති බවට පත්තර දැන්වීමක් පෙන් වූ නමුත් එය මත්පැන්

අලෙවි කිරීම නිසා අය කර ගත් මුදලක් නොවන අතර රු. 30,000.00 ක දඩ පොලිය සමඟ රු. 90,000.00 ක මුදල ලෙස නිවැරදි විය යුතු බව ද පවසන ලදී.

එමෙන්ම සභාවේ ටෙන්ඩර් ක්‍රියාවලියේ දී සම්පත් පියස අසල කඩ කාමරය හා ඉරිදා පොළේ මුරකුටිය ටෙන්ඩර් කරන ලෙස තමන් යෝජනා කරන බව පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් ව්‍යාපාරික ස්ථාන ලෙස සභාවෙන් නම් කළ ස්ථාන ටෙන්ඩර් කිරීමේ කිසිදු ගැටලුවක් නොමැති අතර, බස් නැවතුම්පළ උඩ කොටසේ තිබෙන සියල්ල විකුණූ නිසා නැවත වියදම් කර මුර කුටි දෙකක් ඉදි කිරීමට සිදු වූ බව ද ආයතන සතු දේපල කුමන හෝ ක්‍රමයකින් ලබා ගෙන වෙනත් අයෙකුට විකුණන බව ද වෙනත් කාර්යයන් සඳහා යොදවා ගත හැකි ගොඩනැඟිලි නිදහස් කර දිගින් දිගටම විකිණීම කළහොත් ආයතනවලට කළ හැකි දෙයක් නැති බව ද එම ස්ථාන තිබෙන ක්‍රමයටම තැබීමට කටයුතු කළ යුතු බව ද පවසන ලදී. එමෙන්ම මුරකුටියෙහි කාර්යය පිළිබඳ තීරණ ගැනීම සභාවේ පරිපාලනයේ වගකීමක් වන අතර, බස්නැවතුම්පළ වැසිකිළි ඉවත් කර ව්‍යාපාරික ස්ථාන බවට පත් කර සිදු කළ විකිණීම් පිළිබඳව දන්නා බව ද මහජන නියෝජිතයින් වශයෙන් ජනතාව වෙනුවෙන් විනිවිදව යුතුකම් වගකීම් ඉටු කළ යුතු බව ද වෙන දේ දූන දූනම ඒ සඳහා අවස්ථාව ලබා දීම නිවටකමක් බව ද වැඩිදුරටත් පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා නැවතත් අදහස් දක්වමින් පැවසූයේ අවශ්‍ය නම් කොමසාරිස්තුමාගේ අනුමැතියට යොමු කරන ලෙස ද නගර සභාවේ දේපල බදු දීම සභාවේ ආදායම් මාර්ගය වන අතර පසුගිය කාලයේ සිදු වූ කඩ පැවරීම් නීත්‍යානුකූලව තහනම් බව ද පිළිසරු ව්‍යාපෘතියෙන් ඉදි කළ ස්ථානයේ ව්‍යාපාරයක් සඳහා ලබා දී ඇති බැවින් මෙම ස්ථාන සියල්ල ටෙන්ඩර් පටිපාටියක් මඟින් ලබා දිය යුතු බව ද පැවසීය.

ගරු සභාපතිතුමා පැවසූයේ තමන් මේ පිළිබඳව පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් විමසා තීරණයක් ගෙන තිබෙන නමුත් එය පැවසීමෙන් සභාවේ මතය වෙනස් විය හැකි නිසා මේ ගැන තීරණයක් සභාවට ගැනීමට අවස්ථාව ලබා දුන් බව පවසන ලදී.

මේ සම්බන්ධව අදහස් දෙකක් මතුවීම නිසා ඉරිදා පොළේ පවතින මුර කුටිය ටෙන්ඩර් පදනම මත සුදුසු ටෙන්ඩර්කරුවෙකුට ලබා දීමට පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට යොමු කිරීම සඳහා වන යෝජනාවට පක්ෂ හා විපක්ෂ බව විමසීම සඳහා බෙදීමක් ලබා දෙන ලෙස ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද, රහස් ඡන්දයක්ද යන්න යෝජනා ස්ථිර කර ගන්නා ලෙස ගරු සභාපතිතුමන් විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

එහි දී විවෘත ඡන්දයකට යාම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ අනුව ඉරිදා පොළේ පවතින මුර කුටිය ටෙන්ඩර් පදනම මත සුදුසු ටෙන්ඩර්කරුවෙකුට ලබා දීමට පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට යොමු කිරීම සඳහා වන යෝජනාවට පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම් වෙත දැනුම් දෙන ලදී.

මෙහිදී, එම යෝජනාවට පක්ෂව එක් සභිකයෙකු එනම්,

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |

විපක්ෂව සභිකයින් දස දෙනෙකු ද එනම්,

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ජී. වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රී | කේ.පේමදාස මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | තරංගනී සමරසේකර මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ද |

ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි සභිකයින් හතරදෙනෙකු එනම්,

| | |
|---|---|
| 1. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |
| 4. ගරු නාගරික මන්ත්‍රිනී | එම්.ශාන්තිලේඛා මැතිතුමිය |

සභාවේ නොසිටි සභිකයන් දෙදෙනෙකු එනම්,

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා |

ඒ අනුව ඉරිදා පොළේ පවතින මුර කුටිය ටෙන්ඩර් පදනම මත සුදුසු ටෙන්ඩර්කරුවෙකුට ලබා දීමට පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට යොමු කිරීම සඳහා වන යෝජනාව වෙනුවෙන් පක්ෂව ඡන්ද 01ක් ද, විපක්ෂව ඡන්ද 10 ක් ද වශයෙන් වැඩි ඡන්ද 09 කින් ප්‍රතික්ෂේප විය.

මෙහි දී ගරු සභාපතිතුමා පැවසුයේ පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් කළ විමසීමේ දී ටෙන්ඩර් කළ නොහැකි බව පැවසූ බැවින් දැන දැන වැරදි තීන්දුවක් ගැනීම තමන් විසින් සභාවට කරන අගෞරවයක් බව ය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදේශයක් තිබිය දී අද දින මේ සඳහා පක්ෂව තීරණයක් ගත්තේ නම් එය වැරැද්දක් වන අතර, මන්ත්‍රී යෝජනා ලබා දීමේ දී කළ නොහැකි බවට ප්‍රතික්ෂේප කර ලිඛිතව ලිපියක් යැවීම ගරු සභාපතිවරයාට කළ හැකිව තිබූ බව පවසන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම් රුමි මැතිතුමා පැවසුවේ ද සභාපතිවරයා මේ ගැන සභාව දැනුවත් කළ යුතුව තිබූ බවයි.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් තමන් මීට පෙර සභා කිහිපයක දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා විසින් කරන ලද ඉල්ලීම් 04 ක් ප්‍රතික්ෂේප කළ අතර, මෙය එයින් එක් ඉල්ලීමක් බව ද සභාවට පැමිණීමට පෙර සංවිධායකතුමා සමඟ කළ සාකච්ඡාවේ දී මෙය ඉටු කළ නොහැකි බවට දැන්වූ බවද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා පෙ.ව 11.24 ට සභාවට පැමිණෙන ලදී.**

**07:03 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

07:03:01 වසර ගණනාවක් ඉල්ලීම් කලත් තවමත් ලැබී නොමැති ජල සම්පත් මණ්ඩලයෙන් ඉල්ලීම් කළ ගිනි නිවන රථයට අවශ්‍ය ජල කරාම ලබා දීමට කටයුතු කිරීම

(ගිනි ගැනීමේ ආසන්නතම සිදුවීම - නගරයේ මහ පල්ලිය ඉදිරිපිට වෙළඳසැල් දෙක ගිනි නිවන රථය පැමිණෙන විටත් ගිනි බත් වී අවසානයි)

07:03:02 2023 වසරේ නව වෙළඳ බලපත්‍ර දීමේ දී කුඩා ගිනි නිවන උපකරණයක් වෙළඳසැල්වල සවි කිරීමට බල කිරීම සහ උනන්දු කිරීම

07:03:03 නගරයට බලපෑ ගංවතුර තත්ත්වයට විසඳුමක් ලබා දීමට කටයුතු කිරීම

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ඉහත යෝජනා කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙස තමන් යෝජනා කරන බව ද ජල කරාම ලබා දීම විශාල කාර්යයක් නොවන අතර, අවම වශයෙන් වෙළඳසැල් 15 කට එකක් වශයෙන් හෝ ලබා දී ආසන්නතම වෙළඳසැලට එහි වගකීම ලබා දීම සුදුසු බවද පවසන ලදී.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ පාලන කාලයේ දී දොරවෙල ඔය පාලම දක්වා පුළුල් කිරීම නිසා ගංවතුර තත්ත්වය පාලනය වූ බැවින් එතුමාට ඒ සම්බන්ධව ස්තුතිය පළ කරන බව ද නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කර පහළ ප්‍රදේශය සුද්ධ කර ගඟ පුළුල් කරහොත් ගංවතුර ප්‍රශ්නය නිරාකරණය වන බව ද මේ පිළිබඳව නොසලකා හැරියහොත් නාගරික මන්ත්‍රීවරුන් සියලුම දෙනා වැරදිකාරයන් වන බව ද වැඩිදුරටත් පැවසීය.

2023 වසරේ නව වෙළඳ බලපත්‍ර දීමේ දී කුඩා ගිනි නිවන උපකරණයක් වෙළඳසැල්වල සවි කිරීමේ යෝජනාව සම්බන්ධව අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, වෙළඳ බලපත්‍ර ලබා දීමේ දී පවතින කොන්දේසිවලට මෙම කාරණය ඇතුලත් කිරීම සුදුසු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා පැවසුයේ තමාගේ පාලන කාලය තුල තමන්ට ඇති වූ පීඩාකාරී තත්ත්වය මත කුඩා ගිනි නිවන උපකරණයක් වෙළඳසැල්වල සවි කිරීමේ කාර්යය ඉටු කර ගත නොහැකි වූ අතර, ආදායම් ප්‍රගතිය වෙනුවෙන් නිළධාරීන් වර්ෂය අවසානයේ මහන්සි වන බැවින් මුල් කාලයේ දීම වෙළඳ බලපත්‍රයට ඇතුලත් කර අවශ්‍ය පියවර ගැනීම සුදුසු බව සභාවේ ගිනි නිවීමේ කටයුතුවල නියැලෙන සේවකයන්හට ආරක්ෂක ඇඳුම් නොමැති අතර, ඒ අය වෙනුවෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීමට හා අවශ්‍ය උපකරණ ලබා ගැනීමට සූදානම් වූ බව ද පැවසීය.

එමෙන්ම දොරවෙල ඔය ගංවතුර වැළැක්වීම සඳහා තමන්ගේ ඉල්ලීම මත වැඩ අධිකාරීතුමා විසින් දීර්ඝකාලීන සැලැස්මකට අනුව ව්‍යාපෘතියක් සකස් කළ අතර, එහි ඉතිරි කොටස හැකි ඉක්මනින් අවසන් කළ යුතු බව ද සුද්ධ කළ කොටස නැවත ගොඩ වී ඇති අතර, ලාල් කුෂන් ස්ථානයේ පවතින කාණුව සෑදීමට සභාවේ අරමුදල් යෙදවීමට අවස්ථාව ලබා නොදුන් නමුත් මෙම පාලන කාලය තුල හෝ එය ඉටු කරන ලෙස ද වැඩිදුරටත් පවසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 07:03:01 හා 07:03:02 යෝජනා දෙක ඉතා කාලෝචිත යෝජනා බවත්, ඒ සඳහා සම්බන්ධීකරණ කමිටුවේ විශේෂ ප්‍රමුඛතාවයක් ගෙන සාකච්ඡා කරන බවත් පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා පෙ.ව.11.47 ට සභාවට පැමිණෙන ලදි.**

**08. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**08:01 2022-08-04 දිනැති කර්මාන්ත කමිටු වාර්තාව**

i. සංවර්ධන කටයුතු සඳහා ලබා දෙන මන්ත්‍රී යෝජනා වෙනුවෙන් නිර්දේශ ලබා දීම

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද කාරක සභා වාර්තාවල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**09. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

**2022-07-01 සිට 2022-07-31 දක්වා ආදායම් හා වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 15,127,628.47 |
| වෙනත් ලැබීම් | 4,893,777.20 |
| මුලු ලැබීම් | 20,021,405.67 |
| පුනරාවර්තන වියදම් | 8,893,870.48 |
| වෙනත් වියදම් | 2,763,195.05 |
| මුලු වියදම් | 11,629,544.62 |

**2022-07-01 සිට 2022-07-31 දක්වා ඉන්ධන වාර්තාව**

| වාහන අංකය | මුළු එකතුව |
|---|---:|
| RD-8000 | 21,160.00 |
| 56-1906 | 27,140.00 |
| 227-5020 | 146,760.50 |
| RD - 8240 | 77,510.00 |
| VI1833 | 8,800.00 |
| 226-7521 | 21,620.00 |
| BC-0005 | 82,800.00 |
| GC 0001 | 3,780.00 |
| LL - 7688 | 25,300.00 |
| DPP 0006 | 13,600.00 |
| JD-4684 | 8,400.00 |
| ND-5124 | 66,700.00 |
| PF-4006 | 88,780.00 |
| QL-2901 | 6,720.00 |
| RC-1107 | 71,106.00 |
| RC 1118 | 79,580.00 |
| GK 1483 | 86,747.00 |
| ZA9835 | 735.00 |
| LL 2110 | 92.00 |
| SDRRY0013 | 4,600.00 |
| UQ1933 | 8,400.00 |
| HF 7899 | 82,800.00 |
| OV/M 0017 43 | 19,780.00 |
| RC 8183 | 119,867.00 |
| RB 4786 | 9,200.00 |
| එකතුව | **1,027,217.50** |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**10. ඇස්තමේන්තු අනුමත කිරීම**

**11. පෞද්ගලික මන්ත්‍රි පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය අදහස් දක්වමින් ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට හා ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට සුභ පැතුම් එක් කරන බවත්, මේ වන විට ගෑස් ඉන්ධන ඇතුළු ජනතාවට බලපෑ ගැටලු සඳහා විසඳුම් ලැබෙන බව දක්නට හැකි බවත් පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් අද දින නවක නාගරික මන්ත්‍රීවරයෙක් ලෙස පැමිණි එස්.ඒ. ජෝර්ජ් මහතා වෙත සුභ පැතුම් එක්කරන බව ද ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාගේ ප්‍රතිපාදනවලින් ක්‍රීඩා පිටියේ වැඩ කටයුතු 90% ක් පමණ අවසන් කර ඇති අතර, භූමිය මට්ටම් කිරීම මඟින් පිට්ටනිය යම් තත්ත්වයකට පත් කර ගත හැකි බැවින් ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ද මහජන පොළෙහි ජලය පිරී පවතින අතර, ගලිවලවල් පිළිබඳව තීරණයක් ගන්නා ලෙස ද මහජන පොළෙන් ඇවිදින මංතීරුවට පිවිසෙන ස්ථානයට ගේට්ටුවක් සවි කරන ලෙස ද මීට පෙර අවස්ථා ගණනාවක දී තමන් යෝජනා කළ විකල්ප මාර්ගය සකස් කරන ලෙස ද නගරයේ විදුලිය නොමැති වීම නිසා හොරකම් ආදිය සිදු වන බැවින් විදුලිය ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ද ඇතැම් වෙළඳසැල්වල විදුලි කාන්දුවීම් සිදු වන අතර, වෙළඳ බලපත්‍රය ලබා දීමේ දී ව්‍යාපාරිකයන්ට ඒ සම්බන්ධව මතක් කර දෙන ලෙස ද පවසන ලදී.

එමෙන්ම මර්කන්ටයිල් හන්දිය ක්‍රමවත් ලෙස නිර්මාණය කිරීම, කල්තොට පාරේ ඇකඩමිය අතුරු මාර්ගයේ ඉතිරි වී ඇති 50%ක වැඩ ප්‍රමාණය අවසන් කිරීම, නගරයේ කාණු හා වැහි පීලී පිරිසිදු කිරීම මෙන්ම මහජන පොළ වැසිකිළිය පිටුපස කසළ එකතු වී ඇති බැවින් එම ස්ථානය පිරිසිදු කිරීම ආදිය සිදු කළ යුතුව ඇති බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා අදහස් දක්වමින් ශ්‍රී ලංකාව මේ වන විට ජාත්‍යන්තර අර්බුදයකට මුහුණ පා සිටින අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සහය ලබා ගැනීම සම්බන්ධව චීනය විරුද්ධ වන්නේ කොන්දේසි රහිතව විශාල පොළියකට ණය ලබා දීම නිසා හා ණය ගෙවීමට නොහැකි වන විට රටේ පවතින සම්පත් ඒ වෙනුවට ලබා ගැනීම සඳහා බව ද පවසන ලදී.

එමෙන්ම ඉන්දියාව ඇමරිකාව විසින් මෙහෙයවනු ලබන අතර, යුද්ධ ඇති විය හැකි කාරණා රැසක් පවතින බැවින් යම් කිසි අවස්ථාවක යුද්ධයක් ඇති වුවහොත් අපේ රට තවදුරටත් අර්බුදයකට ලක් විය හැකි බව ද ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාහට යුරෝපා රටවලින් උදව් ලැබෙන බව පැවසූව ද එය එසේ නොවන අතර, සැප්තැම්බර් මාසයේ දී රැස්වන එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් බරපතල චෝදනා ගණනාවක් ඉදිරිපත් කළ හැකි බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා තවදුරටත් අදහස් දක්වමින් හිටපු ගරු අගමැතිනී සිරිමාවෝ බණ්ඩාරණායක මැතිතුමියගේ පාලන කාලය තුල කිසිදු රටක් සමඟ බැඳීමක් නොමැතිව රාජතාන්ත්‍රික සබඳකම් පැවතුණු අතර, එම කාලයේ අනිකුත් රටවලින් උදව් ලැබුණු බව ද එතුමිය ඉතා දක්ෂ ලෙස කටයුතු කළ නමුත් අද වන විට එවැනි තත්ත්වයක් රට තුළ නොමැති බව ද පවසන ලදී.

එමෙන්ම ඇතැම් ද්‍රව්‍ය අඩු වන විට තවත් දෙයක් වැඩි වන බැවින් ජන ජීවිතය පවත්වා ගෙන යාමට නොහැකි බරපතල තත්ත්වයක් නිර්මාණය වී ඇති බව ද පාර්ලිමේන්තුව උත්සාහ කරන්නේ එම අයගේ

අර්බුද විසඳාගැනීමට මිස රටේ අර්බුද විසඳා ගැනීමට නොවන බව ද රනිල් වික්‍රමසිංහ මැතිතුමා එක්සත් ජාතික පක්ෂය නැවත ගොඩ නංවන බව ද ඉතිහාසයේ එවැනි දේ සිදු ව ඇති බවද පැවසීය.

ජනතාව ඉල්ලන්නේ System Change එකක් වන අතර, ඒ සඳහා මහ මැතිවරණයක් අවශ්‍ය බව ද මැතිවරණය සඳහා යුරෝපා සංගමයේ රටවල් අවශ්‍ය කරන මුදල් ලබා දෙන බව ද මැතිවරණ රාජකාරී දීමනා නොමැතිව ඉටු කර දීමට රජයේ නිළධාරීන් සූදානම් බව ද ජනමතයක් නොමැතිව පාර්ලිමේන්තුවේ බලය තිබීමේ එලක් නොමැති අතර රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති වන්නේ අරගලයේ ප්‍රතිඑලයක් වශයෙන් බව ද අරගලකරුවන් මර්දනය කිරීම එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ දී මතු විය හැකි බව ද GSP + සහනය නැතිවේ යැයි බියක් පවතින අතර, අමුද්‍රව්‍ය නොමැතිකම නිසා කර්මාන්ත වැසී යන තත්ත්වයක් පවතින බව ද රටේ ශ්‍රම බලකායේ සෑම පැයකටම 23 දෙනෙක් විදේශ ගත වන බැවින් ඉදිරියේ දී වයසක පුද්ගලයන් පමණක් ඉතිරි විය හැකි බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා, ලෝක ආහාර සංවිධානය ලංකාවේ ජනගහනයෙන් 30%ක් පමණ ආහාර එක වේලක් හෝ දෙකක් පමණක් ගන්නා බවට වාර්තා කර ඇති අතර, ඉදිරියේ සුභවාදී තත්ත්වයක් දක්නට නොලැබෙන බව ද නගර සභාවක් වශයෙන් අපට කළ හැකි මූලික දේ කරමුයි යෝජනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් අද දින මන්ත්‍රීවරයෙක් වශයෙන් පැමිණි එස්.ඒ.ජෝර්ජ් මැතිතුමාට සුභ පතන අතර, තමන් 1991 දී නගර සභාවට විපක්ෂ මන්ත්‍රීවරයෙක් වශයෙන් පත්ව ආ බව ද ඒ වන විට ට්‍රැක්ටර් 02 ක් පැවති අතර, 1997 දී නගර සභාවේ බලය බලෙන් ලබා ගෙන මල්ලිකා රත්වත්තේ මැතිණිය සකස් කළ නව නගර සැලැස්ම ක්‍රියාත්මක කළ බව ද එම වකවානුව තුළ ගලි බවුසරය, ටිපර් රථය,ගිනි නිවන රථය, ජල බවුසරය, ඩබල් කැබ් රථය, වෑන් රථය හා ට්‍රැක්ටර් රථ පළාත් පාලන අමාත්‍යාංශය හා පරිසර අමාත්‍යාංශය මඟින් ලබා ගැනීමට තමන් කටයුතු කළ බව ද බස් නැවතුම්පොළ වෙන්දේසි කර, මහජන පොළ ඉදි කළ අතර, තානායම නගර සභාවට ලබා ගත්තේ තමන් බව ද හැකි නම් එහි අයිතිය පෙන්වා දෙන ලෙස ද කොම්පෝස්ට් ව්‍යාපෘතිය, තුරු උයන ආදී ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් ජාතික හා ජාත්‍යන්තර සම්මාන හිමි කර ගත් බව ද අවුරුදු 30 ක කාලයක් සභාවේ සිටින්නේ මිනිසුන්ට කඩ ආදිය ලබා දිම නිසා බව ද පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා, අරගලය නිර්මාණය කළේ ජනතා විමුක්ති පෙරමුණ විසින් බව ද අනුර කුමාර දිසානායක මැතිතුමා ජනාධිපති වුවහොත් කොළඹ ප්‍රදේශයෙන් නිවාස සහ රැකියා දෙන බව පවසා තරුණයන් ගෙන් වූ බව ද එය ඔප්පු කිරීමට තමන්ට හැකි අතර, රටවල් 52 ක පමණ ප්‍රමාණයක පවතින එම පක්ෂයේ සංවිධාන විසින් අපේ රටට ආධාර ලබා නොදෙන ලෙස පවසා රට විකෘති කර ඇති බව ද ඉදිරි අවුරුදු 04 ක කාලය ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් ආණ්ඩුව කරගෙන යන අතර, ඉවත් වන්නේ සමගි ජන බලවේගයේ කොටසක් සහ ජනතා විමුක්ති පෙරමුණ පමණක් බව ද මීළඟ පළාත් පාලන මැතිවරණයේ දී තමන් ඡන්දය වෙනුවෙන් ඉදිරිපත් වන බව පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ප.ව.12.25 ට සභාවෙන් පිටවන ලදී.**

**ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා**

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගර සභාවට දෙවතාවක් පත්ව පැමිණ නාගරික මන්ත්‍රීවරයෙක් ලෙස බළන්ගොඩ ජනතාවට විශාල සේවාවක් ඉටු කළ එස්.ඒ ජෝර්ජ් මැතිතුමා වෙත ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සුභාශිංසනය පළ කරන අතර, ඉදිරියටත් ජනතාවට සේවය කිරීමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන බව පවසන ලදී.

එමෙන්ම ව්‍යාපාරික ස්ථානවල ගිනි නිවන උපකරණ සවි කිරීම සම්බන්ධ ලාල් ගලප්පත්ති මැතිතුමා කළ යෝජනාව වෙළඳ සංගමය හරහා ක්‍රියාත්මක කිරීම සුදුසු බව ද ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා විසින් ඉතිහාසය සම්බන්ධව කළ කතාව රසවත් වුව ද ජාතික දේශපාලනය ගැන කතා කිරීම නොව බළන්ගොඩ නගරයේ ජීවත්වන ජනතාවට උචිත වන පරිදි සංවර්ධන කටයුතු පිළිබඳව කතා කරන්නේ නම් වඩාත් හොඳ බව ද මෙම අවස්ථාවේ රටේ නායකත්වය ගෙන ජනතාවට සේවාව ලබා දීමට භාර ගැනීම අභියෝගයක් මෙන්ම ගෞරවනීය කාරණයක් බව ද ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා දක්ෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන බව පෙනෙන බව ද ජනතා විමුක්ති පෙරමුණ හැමදාමත් සෘණාත්මකව සිතන අතර, ධනාත්මකව සිතිය යුතු බව ද පවුල් පාලනය, ආගම්වාදී හා ජාතිවාදී කම් නැති කිරීමට අරගලය නිසා හැකි වූ අතර, අරගලයට තමන් ආශිර්වාද කළ නමුත් පසුව දේශපාලනය අරගලයට ඇතුල්වීම මත අරගලය විනාශ වූ බව ද ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට රට හොඳ තත්ත්වයකට ගෙන ඒමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන බව ද පැවසීය.

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා තවදුරටත් අදහස් දක්වමින් මාර්ග නඩත්තු කටයුතු කිරීමේ දී කර්මාන්ත කමිටු සභාපතිතුමා විසින් යෝජනාව ගෙන ඒමට පෙර හා පසු අදාල ස්ථාන නිරීක්ෂණය කළ යුතු අතර, විශාල ව්‍යාපෘතිවලට නොයා වලවල් පමණක් වසා දමන ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් උඩකන්ද පාර විදුලිය ගැටලුව හා මහමෙව්නා පාරේ ගැටලුව විසඳීම සම්බන්ධව ස්තූතිය පළ කරන අතර, කාණු සුද්ධ කර මාර්ගය උඩට දමා ඇති කසළ ඉවත් නොකිරීම නිසා නැවත කාණුවට වැටෙන බැවින් එම ද්‍රව්‍ය ඉවත් කර දෙන ලෙස ද කාණුව සකස් නොකිරීම මත උඩකන්ද පාර ඉන්ටලොක් ගල් ඇල්ලූ කොටසක් විනාශ වී ගොස් ඇති අතර, ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ද නගරය තුල මාර්ග සංවර්ධන අධිකාරියට අයත් කාණු පිරිසිදු නොකරන නිසා ගැටලු රාශියක් පැන නැඟී ඇති බැවින් මේ සම්බන්ධව එම ආයතනය දැනුවත් කර ලිපියක් යොමු කරන ලෙසද පවසන ලදී.

එමෙන්ම ඇවිදින මංතීරුවේ සිදුවන අශෝබන හැසිරීම් වැළැක්වීමට යම් කිසි පියවරක් ගැනීම සුදුසු අතර, බළන්ගොඩ නගර සභාවට අයත් හිස් ඉඩම් යම් යම් පුද්ගලයන් විසින් අත් කර ගැනීම සිදු වන බැවින් ඉඩම් සම්බන්ධ ලේඛනයක් සභාවට ඉදිරිපත් කරන ලෙසද මෙම රට යළි ගොඩ නැඟීම සඳහා ගරු සංවිධායකතුමිය ඇතුලු අප කණ්ඩායම පාට පක්ෂ භේදයක් නොමැතිව කටයුතු කරන බව ද ගරු නාගරික

මන්ත්‍රී එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා වෙත සුභාසිංශනය කරන බව ද වැඩිදුරටත් පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් ජනතාවට, ප්‍රදේශයට යම් සේවයක් කිරීම සඳහා මැතිවරණ ජයග්‍රහණ ලබා ගෙන බළන්ගොඩ නගර සභාවට පැමිණි නමුත් රටේ පවතින ආර්ථික තත්ත්වය හා දේශපාලන හේතු සාධක මත එය ඉටු කිරීම අඩාල වූ බව ද රට ගොඩනැඟීමට හැකි නායකයෙක් අද පත්ව ඇති බව ද මීට පෙර එතුමා විශාල සංවර්ධන වැඩපිළිවෙලවල් කළ අයෙකු බව ද ගරු සංවිධායකතුමිය ඇතුලු අප කණ්ඩායම ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සහයෝගය ලබා දීමට තීරණය කළ බව ද ප්‍රතිපත්තියක් වශයෙන් කිසිම පක්ෂයක නායකයෙකුට හෝ නායිකාවකට තමන් අපහාස නොකරන බව ද පවසන ලදී.

එමෙන්ම හිටපු ගරු සභාපතිතුමා ඉවසිලිවන්තව කතා කිරීම අගය කරන බව ද කර්මාන්ත කමිටු සභාපතිතුමා තමන් කළ ඉල්ලීම් ඉටු කර දෙනු ඇතැයි අපේක්ෂා කරන බව ද ගරු නාගරික මන්ත්‍රීවරයෙක් ලෙස අද දින පැමිණි එස්.ඒ.ජෝර්ජ් මැතිතුමාට සුභ පතන බව ද ් පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා තවදුරටත් අදහස් දක්වමින් රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා නාගරික මන්ත්‍රී වශයෙන් සිටි කාලයේ දී අඩු ආදායම්ලාභී පවුල් සඳහා බඩු මලු බෙදා දීම වෙනුවෙන් නම් 06 ක් ලබා දුන් අතර, එම පුද්ගලයන් තමන්ට හිමි බඩු මල්ල ලැබේයැයි අපේක්ෂාවෙන් සිටින බැවින් එම නම් 06ට සිදු වූයේ කුමක්දැයි විමසන ලදී. එමෙන්ම උඩකන්ද පාරෙහි වලවල් කිහිපයක් පවතින බැවින් එය වැඩි වීමට පෙර අවශ්‍ය නඩත්තු කිරීම සිදු කරන ලෙස ද තුරු උයනෙහි තරුණ පිරිස්ගේ හැසිරීම්හි ගැටලු පවතින බැවින් ඒ සඳහා පියවරක් ගන්නා ලෙස ද තාර ලැබුණු විගස හුණුකුඹුර පාර සකස් කර දෙන ලෙසද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් පක්ෂ පාට භේදයක් නොමැතිව රට ගොඩනැඟීම සඳහා කටයුතු කරන ගරු ජනාධිපතිතුමාට සහ අගමැතිතුමාට සුභ පැතුම් එක් කරන අතර, ඒ සඳහා අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන බව ද අද දින ගරු නාගරික මන්ත්‍රීවරයෙක් වශයෙන් පත්ව පැමිණි එස්.ඒ.ජෝර්ජ් මැතිතුමාට සුභ පතන බව ද ගරු සභාපතිතුමා විසින් මන්ත්‍රී යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දුන් රුපියල් ලක්ෂ 10 ක මුදලින් සංවර්ධන කාර්යයන් සාර්ථකව ඉටු කර ගත් අතර, මුදල් වියදම් කිරීමකින් තොරව ඉටු කර ගැනීමට අවශ්‍ය අවදානම් සහිත නඩත්තු යටතේ කළ හැකි යෝජනා දෙකක් කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කළ බව ද එම යෝජනා දෙක සහ හැකියාවක් තිබේ නම් කම්කරුවන් දෙදෙනෙකු යොදා පාරවල් සුද්ධ කර දෙන ලෙස ද ගෙවතු වගාව සඳහා ලබා දුන් බීජ පැකට් ඉතුරු වී තිබේ නම් මිනිසුන්ට බෙදා දීම සඳහා ලබා දෙන ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් අද දින සභාවට පත්ව පැමිණි එස්.ඒ.ජෝර්ජ් මැතිතුමාට සුභ පැතුම් එක්කරන බව ද කර්මාන්ත කමිටුව වෙත මාස ගණනාවක සිට තමන්

යෝජනා ලබා දුන් බව ද ලේඩිස්මිත්වත්ත පාරට තාර දැමූ අතර, දෙවන වර තාර දැමීම නොකළහොත් පාර අබලන් විය හැකි බව ද සුනන්දාරම පාරට තාර දැමිය යුතු අතර, තලාවගෙදර පාර පස් යොදා සකස් කර දෙන ලෙස ද පවසන ලදි.

එමෙන්ම අරගලය ආරම්භ වූ කාලයේ දී සැබෑ උවමනාවක් තිබූ දේශපාලන ප්‍රතිසංස්කරණ බලාපොරොත්තු වුණු පිරිසක් සිටි නමුත් පසුව එය තුල දේශපාලන න්‍යාය පත්‍ර ක්‍රියාත්මක කරන පිරිස් එක් වූ බව ද 74 වසරක දේශපාලන ඉතිහාසය තුල හිටපු ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ පාලන කාලය වසර දෙක හමාරක් පමණක් වූ අතර, දේශපාලන ඉතිහාසයට දොස් කිවුවත් එම ඉතිහාසය තුල හය වරක් පාලනය කළ රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති බවට පත් වූ බව ද ඉතිහාසයේ සිදු වූ සියලු පව් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ගෙවන්න සිදු වූ බව ද දේශපාලන ප්‍රතිසංස්කරණ අවශ්‍ය වන අතර, ජනතාව ඉන්න තැනින් පහළට දැමීමට බලාපොරොත්තු වන්නේ නම් එය හොඳ දෙයක් නොවන බව ද මැතිවරණය පවතින කාලයක ජනතාව අවශ්‍ය තීරණයක් ගනු ඇති නමුත් මෙම කාලය තුල දේශපාලන න්‍යාය පත්‍ර ක්‍රියාත්මක නොකර මිනිසුන්ට යම් සහනයක් ලබා දීමට ඉඩ දිය යුතු බව ද ලෝකයේ දේශපාලන අස්ථාවරත්වයක් පවතින අතර ඒවායේ යම් ප්‍රතිඵල අපට අත් විඳීමට සිදුව ඇති බව ද සිපවසන ලදී.

එමෙන්ම රටට විශාල ආදායමක් ලබා දෙන GSP + සහනය නැවැත්වීමට යම් කිසි පිරිසක් කටයුතු කරන්නේ නම් එය දේශපාලන න්‍යාය පත්‍රයට නොගැලපෙන බව ද පසුගිය පාලන කාලයන් තුල ආදායමක් ලබා ගත නොහැකි ණය බරක් පමණක් එකතු වුණු ව්‍යාපෘති නිසා එහි බලපෑම අද අත්විඳින බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ප.ව.12.55 ට සභාවෙන් පිටවන ලදි.**

**ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් පසුගිය සභාවක දී තමන් පැවසූ කිරිඳිගල කාපට් පාරේ අඩුපාඩු සම්බන්ධව ඉක්මන් විසඳුමක් ගන්නා ලෙස ද රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් අඩු ආදායම්ලාභී පවුල් සඳහා බඩු මලු බෙදා දීම වෙනුවෙන් ලබා දුන් අයදුම්පත්‍ර ග්‍රාම නිළධාරී අනුමත කරනු ලැබූ සම්පූර්ණ කළ අයදුම්පත්‍ර බව ද ඒ සඳහා විසඳුමක් ලබා දෙන ලෙසද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් ඉතාමත් දක්ෂ හා පක්ෂය වෙනුවෙන් සහයෝගය ලබා දෙන එස්.ඒ. ජෝර්ජ් මැතිතුමාට ජනතාව වෙනුවෙන් සේවය කිරීමට අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන බව පවසන ලදී.

එමෙන්ම මන්ත්‍රී යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අයවැය මඟින් රුපියල් ලක්ෂ 10 ක මුදලක් වෙන් කළ අතර, එම මුදලින් මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුට සංවර්ධන කාර්යයන් ඉටු කර ගැනීමට නොහැකි වූ බැවින් ඔවුන් හට එම අවස්ථාව සලසා දෙන ලෙස ද හිටපු සභාපති ඩබ්.එම්.එන්.ජී වීරසිංහ මැතිතුමා තමා විසින් තමාවම වර්ණනා කර ගත් නමුත් කළ යුත්තේ අනිකුත් මන්ත්‍රීවරුන් විසින් වර්ණනා කිරීම මිස තමා විසින් වර්ණනා කර ගැනීම නොවන බව ද හිටපු ගරු සභාපතිවරුන් සියලුම දෙනා සභාවට, ජනතාවට

කිසියම් හෝ සේවයක් ඉටු කළ බව ද තමාගේ යොජනාව මත මහජන පොළෙහි කොම්පෝස්ට් අලෙවි කිරීමේ ස්ථානයක් ලබා දීම පිළිබඳ ස්තුතිවන්ත වන බව ද එම ස්ථානයට වඩා තාවකාලිකව මුර කුටිය පවතින ස්ථානයේ කොම්පෝස්ට් අලෙවි කිරීමට හැකියාවක් ලැබේ නම් එය වඩාත් සාර්ථක බව ද කොම්පෝස්ට් අංගනයේ වගා කර ඇති එළවළු විකිණීමට එම ස්ථානය යොදා ගත හැකි බව ද කාර්යාලයක් වශයෙන් පවත්වාගෙන යා හැකි බව ද පැවසීය.

ජාතික දේශපාලනය ගැන කතා කිරීමේ දී ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා අසීරුතා මධ්‍යයේ මෙම රට භාරගත් අතර, එතුමාගේ දක්ෂතාවයන් හඳුනාගෙන එතුමාව යෝජනා කළ පොදු ජන පෙරමුණෙහි සියලුම දෙනාට ස්තුතිවන්ත වන බව ද එතුමා මෙම රට යථා තත්ත්වයකට පත් කරන බව විශ්වාස අතර, දේශපාලන පක්ෂ බේදයකින් තොරව අවශ්‍ය සහයෝගය ලබා දිය යුතු බව ද GSP + සහනය නැවත ලබා ගත් නායකයෙක් වශයෙන් එතුමා එය ආරක්ෂා කර ගන්නා බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් අද දින සභාවට නාගරික මන්ත්‍රීවරයෙක් ලෙස පත්ව ආ එස්.ජී.ජෝර්ජ් මැතිතුමාට සුභ පැතුම් එක් කරන බව ද ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා රට ස්ථාවරත්වයට පත් කිරීමට හැකි දේශපාලන දර්ශනයක් සහිත පුද්ගලයෙක් වන අතර, එතුමා අමාත්‍ය ධූර දැරූ සියලුම ක්ෂේත්‍රයන් ඉහළ තත්ත්වයකට ගෙන ආ දූරදර්ශී දැක්මකින් යුත් අයෙක් බව ද පසුගිය කාල වකවානුවේ හය වරක් අගමැති වූ නමුත් එම කාලයේ ජනාධිපති ධූරය වෙනත් පක්ෂයකින් දැරූ අතර, අභ්‍යන්තර අර්බුද හේතුවෙන් අවශ්‍ය සේවය කිරීමට එතුමාට නොහැකි වූ බව ද පැවසීය.

ප්‍රාදේශීය දේශපාලනයක හෝ නිරත නොවීම නිසා හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට දේශපාලනය හා පරිපාලනය පිළිබඳව දැනුමක් නොමැති අතර, එතුමා අණ දීමට පමණක් දැනුමක් ඇති අයෙකු බව ද පසුගිය දිනක ආරක්ෂක මණ්ඩලය හා බුද්ධි ඒකකය වාර්තාවක් ගරු ජනාධිපතිතුමාට හා අගමැතිතුමාට ලබා දුන් අතර, හිටපු ජනාධිපතිතුමාට විරුද්ධව අරගලය මෙහෙය වූයේ කවුදැයි එහි සඳහන් බව ද පවුල් ආරවුල් නිසා රට අගාධයකට වැටුණු බව ද මාධ්‍ය විසින් ජනතාව රවටා දේශපාලන දැනුමක් නොමැති අයකු ඉහළට ඔසවා සමාජගත කළ අතර රට ගොඩනැඟීමට කිසිවෙකු ඉදිරිපත් නොවූ අවස්ථාවේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉදිරිපත් වී අද වන විට යම් සහනයක් සලසා දී ඇති බව ද වැඩිදුරටත් පවසන ලදී.

එමෙන්ම තමන් ඇතුළු කණ්ඩායම ජනතා විමුක්ති පෙරමුණ සහ පෙරටුගාමී පක්ෂය සමග එකතු වී රට අගාධයට ගෙන යන රාජපක්ෂ පාලනය ඉවත් කිරීම සඳහා මුල සිටම අරගලයේ නිරත වූ අතර, එම කිසිදු අවස්ථාවක රනිල් වික්‍රමසිංහ මැතිතුමාව ජනාධිපති කිරීමේ අපේක්ෂාවක් නොතිබුණු බව ද ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නිවස ගිනි තැබීමේ සිද්ධියේ දී ජනතා විමුක්ති පෙරමුණෙහි වෘත්තිය සමිති නායකයෙක් අරගලයක එවැනි දේ තිබිය යුතු බව පැවසීමත් සමග තමන් එම සියලු කණ්ඩායම්වලින් ඉවත් වූ අතර එම පක්ෂ සම්බන්ධව පැවති ඇල්ම පවා නැති වූ බව ද නිවාස හා දේපල ගිනි තැබීම හා හානි කිරීමට තමන් විරුද්ධ බව ද පැවසීය. අද වන විට සමාජවාදී රටවල් ඉතුරු වී පවතින්නේ ඒකාධිපති පාලනයක් යටතේ වන නමුත් අපේ රට මෙතෙක් පැමිණි ක්‍රමවේදය අනුව වෙනත් කණ්ඩායමකට නැවත

නිවැරදි කළ නොහැකි බව ද දක්ෂ කණ්ඩායමක් අවශ්‍ය බව ද ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනතාවගේ අප්‍රසාදයට ලක් වූ පොදු ජන පෙරමුණෙහි ආරක්ෂකයා බවට පත් වූ අතර, මෙම රට ගොඩ නැංවීම එතුමාගේ චේතනාව වුව ද ජනතාවගේ අපේක්ෂාව වූයේ දේශපාලන රැල්ල අතු ගා දැමීම බව ද මෙම අවස්ථාවේ දී හැමෝම එකතු වී සහායෝගය ලබා දී ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් කටයුතු කළ යුතු බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා තවදුරටත් අදහස් දක්වමින් පොළේ මුරකුටිය සම්බන්ධව අද දින සාකච්ඡා වූ අතර, පළාත් පාලන කොමසාරිස්තුමා උපදෙස් ලබා නොදී සිටියේ නම් ගරු සභාපතිතුමා ඒ පිළිබඳ ඡන්ද විමසීමේ දී පක්ෂව හෝ වැළකී සිටීමට ඉඩ කඩ තිබූ බව ද සභාවේ දේපල අන් සතු කර විකුණා ගැනීමට ඉඩ ලබා නොදෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටින බව ද ඉදිරියේ දී සභාවේ අභිවෘද්ධිය වෙනුවෙන් හැකි දායකත්වයක් ලබා දෙන බව ද රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් අඩු ආදායම්ලාභී පවුල් සඳහා බඩු මලු බෙදා දීම සම්බන්ධව ලබා දුන් අයදුම්පත්‍රවල ඉදිරි තත්ත්වය පැහැදිලි කර දෙන ලෙස ද ඉල්ලමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා අදහස් දක්වමින් තමන් හට නාගරික මන්ත්‍රී ධූරය පිරිනැමූ ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සහ එක්සත් ජාතික පක්ෂයේ ගරු සභාපති, ගරු ලේකම් සහ දිස්ත්‍රික් නායකතුමා ඇතුලු අද දින සුභ පැතුම් එක් කළ සියලු දෙනාටම ස්තුතිය පළ කරන ලදී.

**12. අවසානය**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රීවරුන් සභාව වෙත පැමිණ සභාව තුල නොසිට පිටතට ගොස් සිටීම පිළිබඳව කණගාටු වන බව ද පොළේ මුරකුටිය ලබා දීම සම්බන්ධව තමන් මුල සිටම විරුද්ධ වූ අතර සභා වාර දෙකකට පෙර මෙම කාරණාව ද ඇතුලත් කර ඉල්ලීම් 04 ක ලිපියක් ලැබුණු නමුත් තමන් එය සභාගත නොකළේ ලබා දීමට නොහැකි නිසා බව ද පසුගිය සභා වාර්තාවල තමන් ඒ ගැන ප්‍රකාශ කර ඇති බව ද පවසන ලදී.

එමෙන්ම ජනතා විමුක්ති පෙරමුණෙහි දේශපාලන නායකත්වයන් සෘණාත්මකව සෑම දෙයක් පිළිබඳවම අදහස් දක්වන බව ද  සභාපති ප්‍රමුඛ සභික මණ්ඩලයේ නම් සභාවේ පවතින පුවරුවට ඇතුලත් කර සකස් කරන ලෙස ද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා විසින් එතුමාගේ පාලන කාලයේ කල කී දෑ පැවසූ නමුත් ඒ සඳහා අවශ්‍ය සහා අනුමැතිය ලබා දෙමින් තමන් ඇතුළු මන්ත්‍රී මණ්ඩලය සම්බන්ධ වූ බව ද ජනතාවට වැඩ කරා යැයි පැවසුව ද පසුගිය මැතිවරණයෙන් එතුමා පරාද වූ බව ද පැවසීය.

ගරු සභාපතිතුමා තවදුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමාගේ ඉල්ලීම මත ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා විසින් ඇවිදන මංතීරු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ නමුත් අද වන විට මිනිසුන්ගේ හැසිරීම් නිසා ගැටලු කිහිපයක් ඇති වී ඇති අතර, එය වැළැක්වීමට විවිධ පියවරයන් ගත් බව ද ගරු මන්ත්‍රීවරුන් විසින් වෙනත් කරුණු යටතේ යෝජනා ව්‍යාපෘති ආදිය ගැන සඳහන් කරන නමුත් එම යෝජනා විධිමත්ව ඉදිරිපත් කළ යුතු බව ද කිසියම් පුද්ගලයෙක් ඉල්ලීමක් කළහොත් එය ප්‍රතික්ෂේප නොකර සභාවේ තීරණය සඳහා යොමු කිරීම සුදුසු බැවින් පසුගිය සභාවක දී

පොළේ සුභ සාධක සමිතයට ලබා දී තිබූ කඩ කාමරය වෙනත් අයෙකුට ලබා දීමට යෝජනාවක් ඉදිරිපත් කළ බවද එහි තීරණය සඳහා පළාත් සභාවේ අනුමැතිය හිමි නොවූ බව ද මුර කුටිය පවතින ස්ථානය පොහොර වෙළඳාමට සුදුසු බව තමන්ට සිතෙන බව ද කර්මාන්ත සම්බන්ධ අධීක්ෂණයේ අඩුපාඩු පවතින අතර, පසුගිය දිනක පැවති ජංගම සැලසුම් කමිටුවේ දී ගැටලු කිහිපයකට සාධාරණීය පිළිතුරු ලැබුණු බව ද පවසන ලදී.

එමෙන්ම ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ දක්ෂතාවය අනුව අර්බුදය සමථයකට පත් කර ගැනීම සඳහා කුහක නොවී පොදු ජන පෙරමුණ විසින් එතුමාව යෝජනා කළ බව ද මාධ්‍ය විසින් නිවැරදි දේ පෙන්වනු ලැබුවත් මිනිසුන් විසින් එය වැරදියට ගන්නා බවද තමන් සභාවේ සෑම තනතුරක්ම දරූ අයෙක් වශයෙන් පළපුරුද්දක් සහ දැනුමක් පවතින නමුත් දේශපාලන අස්ථාවරත්වය නිසා බොහෝ දේ කර ගත නොහැකි වී ඇති අතර, හිටපු ගරු සභාපතිතුමාට සිදු වූයේ ද එවැනි ගැටලුවක් බව ද පැවසීය.

ගරු සභාපතිතුමා තවදුරටත් අදහස් දක්වමින් පසුගිය දිනක පැවති සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ දී ප්‍රාදේශීය සභා දෙකෙන් ඉදිරිපත් වූ ගැටලු පිළිබඳව බැලීමේ දී බළන්ගොඩ නගර සභාව 90%ක් පමණ හොඳ තත්ත්වයේ පවතින බව ද ඒ සඳහා ගරු නාගරික මන්ත්‍රීවරුන් හා නිළධාරීන් දක්වන සහයෝගය ඉවහල් වී ඇති අතර, ඉදිරියටත් සහයෝගය ලබා දෙන ලෙස ද තමන් සභාව අඩාල වන තීරණ නොගන්නා බව ද ඉදිරි දිනක තුරු උයනෙහි හෙළ බොජුන්හලක් ඉදි කිරීම සම්බන්ධව දැනුවත් කිරීමක් සිදු කිරීමට අපේක්ෂා කරන අතර, ඒ සඳහා පැමිණෙන ලෙස ද පවසන ලදී.

එමෙන්ම අද දින දෙවතාවක් නගර සභාව නියෝජනය කළ හා කථිකත්වයෙන් යුක්ත එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් පත්ව පැමිණි එස්.ඒ.ජෝර්ජ් මැතිතුමාව පිළිගන්නා අතර, එතුමා නියෝජනය කරන පක්ෂය හා කොට්ඨාසය වෙනුවෙන් සේවය කිරීමට අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන බව ද අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් සියලු දෙනාට ස්තුතිය පළ කරමින් මෙදින මහ සභාවේ වැඩ කටයුතු ප.ව.1.52 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.ඒ.වසන්ත ගුණරත්න,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.